කොළඹ දිසා අධිකරණයේ දී ය.

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 21819/එම්ආර්

— එදිරිව —

1. ශාමිණී ලක්ෂ්මන් පීරිස්
"විසුම්පාය", ස්ටෙපල්ස් වීදිය,
කොළඹ 2 සහ
37, කිරුළ පාර,
කොළඹ 05.

2. හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්
කළම්බු හිල්ටන් ස්පෝට්ස් කම්ප්ලෙක්ස්
බාරේ, එච්ලන් චතුරශ්‍රය,
ලෝටස් පාර, කොළඹ 1.

විත්තිකරුවෝ.

කොළඹ 2, ස්ටෙපල්ස් වීදිය, "විසුම්පාය" හි සහ කොළඹ 05 කිරුළ පාර අංක 37 දරන ස්ථානයේ පදිංචි ශාමිණී ලක්ෂ්මන් පීරිස් වන මම බෞද්ධාගමිකාරයකු වශයෙන් මෙහි පහත දැක්වෙන කාරණා ගම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් සහතික කොට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි:-

01. මෙහි ඉහත නම සඳහන් සහතික ප්‍රකාශක මම වෙමි.

02. මම මෙසේ ප්‍රකාශ කර සිටිමි:

( අ ) වෙනත් කරුණු අතර, පැමිණිල්ල ප්‍රතික්ෂේප කරන ලෙස සහ/හෝ නඩුව නිෂ්ප්‍රභ කරන ලෙස අධිකරණයෙන් අයැදිමින් මම 1999 පෙබරවාරි මස 16 වන දින දරන මෝසමක් ගොනු කළෙමි.

( ආ ) එකී මෝසම පිළිබඳ ආඥාව 1999 මැයි මස 17 වන දින හෝ ඊට ආසන්න දිනයක දී භාර දෙන ලදී.

( ඇ ) නඩුව මුලින් 1999 මැයි මස 17 වන දින හෝ ඊට ආසන්න දිනයක දී විභාග කිරීම සඳහා නියම කරන ලදී.

03. ඉහත කී කරුණු අනුව, කුමන හේතුවක් නිසා හෝ 1999 ජුනි මස 01 වන දින දරන මෙම ඉල්ලීම, මම 1999 ජනවාරි මස 22 වන දින දරන මගේ උත්තරයෙන් ඉදිරිපත් කළ මූලික විරෝධතා පිළිබඳ අධිකරණය විසින් තීරණය කරනු ලබනතුරු, මේ අවස්ථාවේදී පිළිගත නොහැකිය.

04. මෙකී මින්මතු පෙත්සම් කරන මගේ ස්ථාවරය ඉහත කී කරුණුවලට කිසිසේත්ම අගතිදායක නොවන බව මම ප්‍රකාශ කර සිටිමි.

05. [illegible] කරුණු අතර, මෙහි පහත දැක්වෙන හේතු නිසා, අංක 1 සිට 45 දක්වා වූ එකී විචාරණවලට උත්තර සැපයීමට මා නීතියෙන් බැඳී නොමැති බවට මට උපදෙස් ලැබී ඇති නිසා මම එසේ ප්‍රකාශ කර සිටිමි.

06. එකී විචාරණ ගොනු කිරීම සහ ඒ සම්බන්ධයෙන් ඉන්පසුව පැමිණිලිකරු ගත් පියවර අධිකරණ විධාන අනිසි ලෙස යොදා ගැනීමක් බව සහ/හෝ මේ නඩුව තීරණය කිරීම ප්‍රමාද කිරීමේ අදහසින් කරන ලද්දක් බව මම ප්‍රකාශ කරමි.

07. මම මෙසේ ද ප්‍රකාශ කරමි:

( අ ) පැමිණිල්ලෙන් මට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවේ;

( ආ ) පැමිණිල්ල එහි මුහුණත අනුවම කාලාවරෝධයට අසුවී ඇත;

( ඇ ) ඒ අනුව, විචාරණ භාරදීමට හැකි කමක් නැති අතරම ඒවාට උත්තර දීමට හැකි කමක් නැති අතරම ඒවාට උත්තර දීමට මට බලකළ නොහැකි ය.

08. ඉල්ලීම කිරීමේ දී පැමිණිලිකරුගෙන් අනිසි ප්‍රමාදයක් සිදුවී ඇති බවට මට උපදෙස් ලැබී ඇති නිසා මම එසේ ප්‍රකාශ කර සිටිමි.

09. එකී විචාරණ උද්දේශිත නඩුවේ කාර්ය සඳහා සද්භාවයෙන් ඉදිරිපත් කර නොමැති බව මම ප්‍රකාශ කර සිටිමි.

10. එකී විචාරණ අදාළ නොවන බවට මට උපදෙස් ලැබී ඇති නිසා මම එසේ ප්‍රකාශ කර සිටිමි.

11. එකී විචාරණ නීතිය අනුව අපකීර්තිය ගෙන දෙන බවට ද මට උපදෙස් ලැබී ඇති නිසා මම එසේ ප්‍රකාශ කර සිටිමි.

12. ඒ කුමක් වුවත්, එකී විචාරණ ඉදිරිපත් කර ඇත්තේ කාල්පනික ස්වභාවයක් ලෙස බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

13. උද්දේශිත විචාරණවලින් අසන කරුණු මේ අවස්ථාවේදී නඩුවට වැදගත් නොවන බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

14. එකී විචාරණ අසාධාරණ ලෙස සහ/හෝ පීඩාකාරී ලෙස සහ/හෝ අතිශී දීර්ඝ බවකින් යුතුව හරදී ඇති බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

15. එකී ඇතැම් විචාරණ සහ ඒවාට දිය යුතු උත්තර වරප්‍රසාදයට ලක්වන බව මට ප්‍රකාශ කරමි.

16. එකී විචාරණ සමස්තයක් වශයෙන් ගත් කල අනවශ්‍ය ලෙස දීර්ඝ සහ/හෝ පීඩාකාරී සහ/හෝ අනවශ්‍ය බවට මට උපදෙස් ලැබී ඇති නිසා මම එසේ ප්‍රකාශ කර සිටිමි.

17. ඒ කුමක් වුවත්, එකී විචාරණ මේ නඩුවේ විසඳිය යුතු ප්‍රශ්නවලට අදාළ නොවන බවට මට උපදෙස් ලැබී ඇති බැවින් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

18. වෙනත් කරුණුවලට අමතරව ඉහත කී කරුණු අනුව එකී විචාරණ ප්‍රතික්ෂේප කරන ලෙස සහ/හෝ ඒ විචාරණවලට උත්තර සපයන ලෙස පැමිණිලිකරු කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභ කරන ලෙස මම ගෞරවයෙන් අයැද සිටිමි.

කියවා තේරුම් ගෙන වර්ෂ 1999 }
ක්වූ ජූලි මස වන දින }
කොළඹ දී ප්‍රතිඥා දී අත්සන් කරන }
ලදී.---------------------- }

Sgd/
මා ඉදිරිපිට දී ය.

Sgd/
සාමදාන විනිශ්චයකාර.